021

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධි වැඩසටහන 2022/2023

අවසාන පරීක්ෂණය - 2022

**SNPA602 -** විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා සමාජ හා දාර්ශනික පදනම

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2024.02.24 වේලාව : ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

01. (i.) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ ඓතිහාසික පර්යාලෝකය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii.) ශ්‍රී ලංකාව තුළ ආබාධිත පුද්ගලයන්ගේ සහභාගිත්වය සඳහා ඇති අයිතිය දිරිමත් කරන ප්‍රතිපත්ති/රෙගුලාසි/පනත් දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 30)

(iii.) ඉහත ප්‍රතිපත්ති/රෙගුලාසි/පනත් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා රජය මුහුණ දුන් ගැටලු පරීක්ෂා කර ඒවා මගහරවා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 40)

02. (i.) පහත සඳහන් මාතෘකා යටතේ අධ්‍යාපනය පිළිබඳ පෙරදිග සහ අපරදිග දර්ශනය කෙටියෙන් සාකච්ඡා කරන්න.

(අ) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අදහස්

(ආ) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමඟ වැඩකරන ගුරුවරයාගේ කාර්යභාරය (ලකුණු 40)

(ii.) ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පෙරදිග හා අපරදිග දර්ශනවාදී අදහස් අදාළ කරගන්නා ආකාරය සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 40)

(iii.) ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ වර්තමාන ප්‍රවණතා තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 20)

03. "ආබාධිත පුද්ගලයින්ට වෙනස්කොට සැලකීම සමාජය ජය ගැනීමට නොහැකි වූ නරකම සමාජ අසාධාරණයන්ගෙන් එකකි." (මවුරු මෝගේ, 2012)

(i.) "ආබාධිත" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 20)

(ii.) වත්මන් සමාජය තුළ ආබාධිත පුද්ගලයන්ට ඇති බාධක අවම පහක් විස්තර කරන්න. (ලකුණු 40)

(iii.) අප සමාජයේ සිටින ආබාධ සහිත පුද්ගලයන් සඳහා ඇති ඉහත සඳහන් බාධක මගහරවා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 40)

04. "කෙන් ඩේවින් 1990 දී ආබාධිතභාවය ජය ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රියා සඳහා ක්ෂේත්‍ර හතක් ප්‍රකාශ කළේය."

(i.) කෙන් ඩේවින් විසින් ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික ක්‍රියා ක්ෂේත්‍ර තුනක් විස්තර කරන්න. (ලකුණු 30)

(ii.) ඉහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා රජය මුහුණ දෙන අභියෝග විශ්ලේෂණය කරන්න. (ලකුණු 30)

(iii.) ශ්‍රී ලංකාව තුළ ආබාධිත භාවය ජය ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රියා සඳහා වූ ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කරන්න. (ලකුණු 40)

\- සියළුම හිමිකම් ඇවිරිණි. -